## කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය
## ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය ( අධ්‍යයන ධාරා )
## පළමු සෙමෙස්තරය -2018/2019
# SLG 2118 – සිංහල පරිවර්තන සාහිත්‍යය
(පැ දෙකයි)

ප්‍රශ්න **හතරකට (04) පමණක්** පිළිතුරු සපයන්න.

---

01. "රුසියානු කෙටිකතාව, පීඩිත රුසියානු සමාජයෙහි පිළිබිඹුවකි." **සම්භාව්‍ය රුසියානු කෙටිකතා** සංග්‍රහය ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

02. "ජීවිතය පිළිබඳ සංකීර්ණ අත්දැකීම් රැගත් නවකතාවක් ලෙස අර්නස්ට් හෙමිංවේගේ **මහල්ලා සහ මුහුද** නවකතාව හැඳින්විය හැකිය" විමර්ශනය කරන්න.

03. ගුස්ටෝව් ෆ්ලෝබෙයාර්ගේ **එමා බෝවාරි** නවකතාව තත්කාලීන ප්‍රංශ සමාජයෙහි යථාර්ථය ප්‍රතිනිර්මාණයෙහිලා කොතෙක් දුරට සමත් වී ඇත්දැයි සනිදර්ශනාත්මකව විමසන්න.

04. "**නෝරා** යනු පිතෘමූලික සමාජ ක්‍රියාකාරීත්වයට එරෙහිව කැරලි ගැසූ ස්ත්‍රියකි." හෙන්රික් ඉබ්සන්ගේ **බෝනික්කි ගෙදර** නාට්‍යය ආශ්‍රයෙන් විභාග කරන්න.

05. "යටත්විජිතවාදය හමුවේ අභියෝගයට ලක් වූ ඉබෝ ගෝත්‍රික ජන ජීවිතය චිනුවා අචෙබෙගේ **මුහුද ගොඩගලා** නවකතාව මගින් කලාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කෙරේ" විමසන්න.

06. සහෘදයකුගේ ජීවිතාවබෝධය පාථුල කරවීමෙහිලා සිංහල පරිවර්තන සාහිත්‍ය පරිශීලනය මගින් සිදු කෙරෙන මෙහෙය කුමනාකාරදැයි නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

********************